# උතුරු පළාත් සභාව - 2020 වර්ෂය

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

උතුරු පළාත් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2022 පෙබරවාරි 08 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 පෙබරවාරි 15 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2020 ජනවාරි 01 දිනට පැවැති ජංගම නොවන වත්කම් ශේෂයට වඩා රු. 558,375,684ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එදිනට, එම වත්කම්වල ශේෂය ලෙස පෙන්නුම් කර තිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කිරිම සඳහා අවශ්‍ය පහසුකම් සිගාස් පරිගණක වැඩසටහන මගින් ලබා දී නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය පිළිවෙත් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව සමග එකඟතාවකට පැමිණිය යුතුය. |
| (ii) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව, සමාලෝචිත වර්ෂය තුළ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සඳහා වූ පිරිවැය රු. 462,245,370ක් ජංගම නොවන වත්කම් ප්‍රකාශනය යටතේ ප්‍රාග්ධනිත කර නොතිබීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් ජංගම නොවන වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කිරිම සඳහා අවශ්‍ය පහසුකම් සිගාස් පරිගණක වැඩසටහන මගින් ලබා දී නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය පිළිවෙත් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව සමග එකඟතාවකට පැමිණිය යුතුය. |
| (iii) | පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් රු. මිලියන 97.60ක් වටිනා හෙක්ටයාර් 1.337ක වපසරියකින් යුත් ඉඩම් කැබැලි 06ක් සහ රු. මිලියන 11.13ක් වටිනා වාහන 08ක් ACA-6 දරන ජංගම නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. මේ නිසා එකතුව රු.මිලියන 108.73ක ජංගම නොවන වත්කම් වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම්වලට මෙය ගැලපීමට පියවර ගෙන ඇත. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | එකතුව රු.26,242,138ක් වූ බැරකම්, මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ බැරකම් සහ බැඳීම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. පසුව එම බැරකම්, රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2020හි 4.11 ඡේදයට පටහැනිව, ඊට පසු වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. | ගිණුම් වර්ෂයට පසුව කළ සමහර ගෙවීම් බැරකම් ලෙස සටහන් කළ නොහැකි විය. | සියලු බැරකම් නිසි පරිදි සටහන් කළ යුතුය. |
| (v) | පළාත් දෙපාර්තමේන්තු 03කට අයත් වාහන 13කට සිදු වූ අනතුරු වෙනුවෙන් රක්ෂණ ආයතන විසින් ප්‍රතිපූරණය නොකළ රු.10,037,053ක හානි, මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ සටහන් (i) හා (ii) හි හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අතපසු වීම් නිවැරදි කර ගැනීමට කටයුතු කෙරේ. | මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා හානි නිසි පරිදි හෙළිදරව් කළ යුතුය. |

(ආ) **විගණනයට සාක්ෂි නොවීම**

| | | |
|---|---|---|
| සැපයුම්කරුගෙන් හෝ වෙනත් පාර්ශවයකින් හෝ ලබාගත් කිසිදු තහවුරු කිරීමක් රහිතව පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව විසින් රු.10,811,316ක ආහාර ද්‍රව්‍ය සඳහා ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | තහවුරු කිරීමේ සාක්ෂි ප්‍රමාණවත්ද යන්න පිළිබඳ ගෙවීම් සිදු කිරීමට පෙර සලකා බැලිය යුතුය. |

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.5.1 ශීර්ෂය 410 - මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සංචාරක, පළාත්පාලන අමාත්‍යාංශය,**

---

සමාලෝචිත වර්ෂයේදී පළාත් මුදල්, ක්‍රමසම්පාදන හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් කාබනික පොහොර නිෂ්පාදනය හා සනීපාරක්ෂක ඉඩම් ගොඩකිරීම් සංවර්ධනය තිරසාර සංවර්ධන ඉලක්ක ලෙසත්, එම ඉලක්කය ළඟාකර ගැනීමේ දර්ශක ලෙස කාබනික පොහොර නිෂ්පාදනාගාර ප්‍රතිසංස්කරණ සංඛ්‍යාව, කාබනික අපද්‍රව්‍ය එකතු කිරීම් ප්‍රමාණය, නිෂ්පාදනය කරන කාබනික පොහොර කිලෝ ග්‍රෑම් ප්‍රමාණය ආදිය නිර්නය කර ඒවා ළගාකර ගැනීමේ මට්ටම සියයට 75 සිට සියයට 100ක් ලෙස දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිලිනොච්චිය**,** කරච්චි ප්‍රාදේශීය සභාව විසින් රු.3,167,940ක පිරිවැයකින් උමයිල්පුරම්හි ඉදිකළ කාබනික පොහොර සැකසීමේ මධ්‍යස්ථානය වර්ෂ 03ක සිට අභාවිතව පැවතුණි. | මෙම මධ්‍යස්ථානය ඵලදායීව භාවිතයට ගැනීම සඳහා අවශ්‍ය යෝජනා දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | අභාවිත සියලු වත්කම් නොපමාව භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් පාලන ආයතන 17ක් සහිත යාපනය දිස්ත්‍රික්කය තුළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා මේ දක්වා සුදුසු ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථානයක් හඳුනා ගෙන ඇති අතර ප්‍රතිපාදන ලද පසු මෙය ක්‍රියාත්මක කිරීමට නියමිත ය. | මෙවැනි ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය බැහැරකිරීමේ ස්ථානවලට රැගෙන එන අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමේ වැඩපිළිවෙලක් නොතිබුණි. | නිසි පරිදි කටයුතු නොකරන පළාත් පාලන ආයතන වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | එම කාර්යයන් නිසි පරිදි ඉටු කරන බවට තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් කළ යුතුය. |
| (ඈ) | පළාත තුළ ස්ථාපිත පළාත්පාලන ආයතන 34කින් ආයතන 27ක් ම කසළ භාවිතයෙන් කාබනික පොහොර සැකසීම සඳහා පියවර ගෙන නොතිබුණි. | වැය කිරීමට ප්‍රමාණවත් මුදල් ලැබුණු විට මෙම කාර්යයන් ඉටු කිරීමට පියවර ගනු ලැබේ. | මෙවැනි කාර්යයන් සඳහා ප්‍රමුඛතාව ලබා දී ක්‍රියාත්මක කළ යුතුය. |

**1.5.2 ශීර්ෂය 412 - අධ්‍යාපන, සංස්කෘතික කටයුතු, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් මූල්‍ය රීති 420.1(viii) මගින් නියම කළ කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගොඩනැගිලි කුලී ලෙස රු.1,260,000ක් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. | ගරු ආණ්ඩුකාරවරයා විසින් මේ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | පළාත් මූල්‍ය රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ශීර්ෂය 420 - ප්‍රධාන ලේකම්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් මූල්‍ය රීති 219 අනුව, තත් කාර්ය අතුරු අග්‍රිමයක් අදාළ කාර්යය නිම කළ විගස නිරවුල් කළ යුතුය. එහෙත්, ඊට පටහැනිව, අවස්ථා 250ක දී නිකුත් කළ රු.12,735,514ක තත් කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමකර නිරවුල් කිරීමට ගත කළ කාලය දින 07ත් දින 322ත් අතර පරාසයක විය. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය මෙම ප්‍රමාද වීම්වලට හේතුව වී තිබුණි. | අත්තිකාරම් නිරවුල් කිරීමේදි සිදු කරන ප්‍රමාද වීම්වලට එරෙහිව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය අනුව, උතුරු පළාත් සභාව යටතේ පවතින සමහර දෙපාර්තමේන්තු හා ආයතන විසින් සිය කාර්ය මණ්ඩලය සඳහා කාර්යසාධන ඇගයීම් වාර්තා පවත්වා නොතිබුණු අතර වාර්ෂික කාර්යසාධන ගිවිසුම්වලට එළැඹීමට ද පියවර ගෙන නොතිබුණි. එමෙන්ම, නිපුණතා පරතර (Competency Gaps) හඳුනා ගැනීම පිණිස වූ මානව සංවර්ධන සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය පියවර ගැනීමට නියමිතය. | අදාළ චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2008 ජූනි 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කළ විශේෂ ශ්‍රේණීන් වන, පළාත් රාජ්‍ය පරිපාලන සමුපකාර සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තනතුරු සහ 2013 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කළ විශේෂ ශ්‍රේණියක් වූ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලැසුම්) යන තනතුර සඳහා විශේෂ ශ්‍රේණියට අයත් නොවූ නිලධාරීන් තිදෙනෙකු පත්කර ඔවුන්ට විශේෂ ශ්‍රේණියට හිමි | මේ වෙනුවෙන් අවශ්‍ය උපදෙස් සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | මෙවැනි ගැටලු අප්‍රමාදව නිරවුල් කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැටුප් ගෙවීම නිසා එම ශ්‍රේණියට පත් කළ දින සිට 2020 දෙසැම්බර් දක්වා වැටුප් හා දීමනා ලෙස රු.2,192,191ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් සංවර්ධනය වෙනුවෙන් රු. 690,149,699ක් පමණක් වැය කර තිබුණු අතර එම සංවර්ධන කටයුතු ඉටු කිරීම වෙනුවෙන් දරන ලද මුළු පොදුකාර්ය පිරිවැය රු. 28,710,619,161 ක් විය. එනම්, පළාත් සංවර්ධනය වෙනුවෙන් වැය කළ මුදල සමස්ත වියදමින් සියයට 2.4ක් වැනි ඉතා අවම අගයක් ගෙන තිබුණි. | සමස්ත මූලධන වියදමින් 1/3 පමණ පළාත් සංවර්ධනය වෙනුවෙන් වැය කර තිබුණි. | පුනරාවර්තන වියදම් හැකි පමණ පාලනය කරමින් පළාත් සංවර්ධනය සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය. |
| (ඉ) | විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය සැලකීමේදී, උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ (NRCP) සියයට 76ක් හෙවත් රු. මිලියන 63ක් සහ යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන හා පවිත්‍රකරණ ව්‍යාපෘතිය (JKWSSP) වෙනුවෙන් සියයට 96ක් හෙවත් රු. මිලියන 81ක් සමාලෝචිත වර්ෂයේදි පළාත් සභාව විසින් වැය කර නොතිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය මෙන්ම, කාර්යයන් ඉටු කිරිමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී තිබුණි. | ප්‍රමුඛතාව හඳුනා ගෙන කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ඊ) | අනුමත කාර්ය මණ්ඩලයේ 8714කින් පුරප්පාඩු 1934ක් ද, අතිරික්ත 106ක් ද පැවැතිණි. | වාර්ෂික ස්ථාන මාරු යටතේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සේවක සංඛ්‍යා සමාලෝචනයේදී අතිරික්තය පිළිබඳ පියවර ගනු ලැබේ. | සේවක පුරප්පාඩු පිරවීම හා අතිරික්ත සේවකයන් අනුයුක්ත කිරීම ඵලදායී ලෙස ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | පළාත් අභ්‍යන්තර විගණන ඒකකය විසින් සමාලෝචිත වර්ෂයේදී උතුරු පළාත් සභාව යටතේ වූ ආයතනවලට නිකුත් කළ විගණන විමසුම් 106න් 53ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. | සියලු විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත. | අභ්‍යන්තර විගණන විමසුම සඳහා අප්‍රමාදව පිළිතුරු සැපයිය යුතුය. |
| (ඌ) | උතුරු පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම වෙනුවෙන් රු.114,715,921ක් වැයකර තිබුණ ද, එම ගොඩනැගිල්ල පවතින භූමියේ අයිතිය පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. | නොපමාව අයිතිය පවරාගත යුතුය. |

**1.5.4 ශීර්ෂය 421 - පළාත් භාණ්ඩාගාරය**

**------------------------------------**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------- | ------------ |
| (අ) | 2020 දෙසැම්බර් 01 දිනැති අංක PF/AP/02/2020 දරන උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය අනුව, පළාත් භාණ්ඩාගාරය විසින් පිළියෙල කළ යුතු ACA 2 (a) , ACA 2 (a)(i), ACA 2 (a)(ii), ACA 2 (a)(iii) සහ ACA 2 (a) (vi) ආකෘති පත්‍ර කිසිවක් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂය තුළ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් දෙපාර්තමේන්තු 03ක සේවය කර පසුව, උතුරු පළාත් සභාවට පිටතින් වූ රාජ්‍ය ආයතන වෙත ස්ථාන මාරු ලද නිලධාරීන් 55දෙනෙකුගෙන් ලැබිය යුතු රු.5,328,657ක ණය ශේෂයක් ඉකුත් වර්ෂයේ සිට හිඟහිටිව පැවතුණි. | මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | නොපමාව ණය ශේෂ අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 13ක ඉතිරිව පැවැති ප්‍රතිපාදනවලට වඩා රු. 72,925,424ක් බැරකම් සඳහා බැඳී තිබුණි. | අපේක්ෂිත ආදායම් නොලැබීම නිසා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කළ නොහැකි විය. | ප්‍රමුඛතාව හඳුනා ගෙන කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ඈ) | ආදායම් සංකේත 05ක් සඳහා ඇස්තමේන්තු කළ නමුත් නොලද ආදායම රු. 250,278,715ක් විය. එය ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 36ක අගයක් ගෙන තිබුණි. එසේ වුවත්, ආදායම් සංකේත 03ක් සඳහා ඇස්තමේන්තුගත ආදායමට වැඩියෙන් රු. 13,114,271ක් ලැබී තිබුණු අතර එය ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 82ක වර්ධනයක් විය. | ඉදිරියේදී නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගනු ලැබේ. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය. |
| (ඉ) | පළාත් දෙපාර්තමේන්තු 06ක සේවය කර, පසුව රාජකාරියට වාර්තා නොකළ, මියගිය, විශ්‍රාම ගිය සහ සේවයෙන් පහ කළ නිලධාරීන් 39 දෙනෙකුගෙන් රු. 2,781,384ක ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුපෙන් හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති අතර ඉතිරි ශේෂ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ශේෂ අප්‍රමාදව අයකරගත යුතුය |

**1.5.5 ශීර්ෂය 425 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාව විසින් වර්ෂ 02කට අධික කාලයක සිට රු. 82,046,665ක මුද්දර ගාස්තු ආදායමක් එකතු කර තිබුණි. එකතු කළ මුද්දර ගාස්තුවල හිමිකම කුමන පළාත් පාලන ආයතනවලට ද යන්න නිරවුල් කර ගැනීමට පළාත් සභාව අපොහොසත් වීම නිසාත්, ඒ ඒ පළාත් පාලන ආයතන වෙතින් ඉල්ලීම් ඉදිරිපත් නොවීමත් නිසා එකතු කළ එම සියලු ආදායම් පළාත් සභා ආදායමට බැරකර තිබුණි. | මුද්දර ගාස්තු හිමි පළාත් පාලන ආයතන හඳුනා ගැනීමට නොහැකි වීම නිසා එම මුදල් ආදායමට බැර කිරීමට සිදු විය. | පළාත් පාලන ආයතන නිශ්චිතව හඳුනා ගැනීමට හැකි වන පරිදි ක්‍රමවේදයක් සකස් කරගත යුතුය. |

**1.5.6 ශිර්ෂය 450 - සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**-----------------------------------------**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------- | ------------ |
| (අ) | පළාත් මූල්‍ය රීති 76 පරිදි, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල කිසිවක හානි ලේඛන නඩත්තු කර නොතිබුණු අතර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් හානි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | හානි ලේඛන නඩත්තු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | පළාත් මූල්‍ය රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය |
| (ආ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 10 දෙනෙකුට රු.1,643,018ක අතිකාල දීමනා වැඩියෙන් ගෙවා තිබුණි. | මෙම මුදලින් කොටසක් අයකළ අතර ඉතිරි මුදල් අය කරමින් පවතී. | හිඟ ශේෂ අප්‍රමාදව අයකරගත යුතුය. |
| (ඇ) | පූනාකරි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් 2018 අප්‍රේල් මාසයේදී රජය සතු රු.9,000,000ක් වටිනා කැබ් රථයක් පෞද්ගලික අවශ්‍යතාවක් වෙනුවෙන් ධාවනය කරන අතරතුර අනතුරට පත් වී මුළුමනින්ම විනාශ වී තිබුණි. වාහන අනතුර පිළිබඳව 2018 මැයි මාසයේදී මූලික විමර්ශනය සිදුකර ඉදිරිපත් කළ කෙටුම්පත් චෝදනා පත්‍රයේ සඳහන්ව තිබුණු පරිදි, අනුමැතියකින් තොරව වාහනය භාවිතා කිරීම, රාජකාරි නොවන පාර්ශවයන් කැඳවාගෙන යාම සහ නීතියට පටහැනිව වේගයෙන් රිය පදවා රජයේ දේපළවලට විශාල පාඩු සිදුකිරීම සම්බන්ධයෙන් වාර්තා කරන දින දක්වා විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවසන් විමර්ශන වාර්තාව මේ දක්වාම ලැබී නොතිබුණි. | චෝදනාපත්‍ර භාරදී නොපමාව විධිමත් විනය පරීක්ෂණයක් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | උතුරු පළාත් රෝහල්වල අනුමත කාර්ය මණ්ඩලයෙන් වෛද්‍යවරුන් සියයට 26ක් ද, හෙදහෙදියන් සියයට 18ක් ද පුරප්පාඩුව පැවැතිණි. | මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කටයුතු සිදු කෙරේ. | අත්‍යාවශ්‍ය වූ මෙ ම පුරප්පාඩු නොපමාව පිරවිය යුතුය. |

**1.5.7 ශිර්ෂය 431- වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

-------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | --------------------- | ------------ |
| (අ) | යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන හා පවිත්‍රකරණ ව්‍යාපෘතිය මගින් රු.400,280,744ක වියදමින් ඉරණමඩු ජලාශයේ අතිරික්ත ජලවහනය සඳහා ලෝහමය වාන් දොරටු 14ක් හා සොරොව් දොරටු 02ක් සකස් කර තිබුණි. ප්‍රමාණවත් ජල ධාරිතාවක් එම දොරටු වෙත මුදා හැරීමට නොහැකි වීම හේතුවෙන් ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ඇගයීමක් සිදු කිරීමට නොහැකි වී තිබුණි. එහෙත්, ඒ පිළිබඳ සැළකිලිමත් නොවී අදාළ කාර්යය වෙනුවෙන් වූ මුළු මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. පසුව, ප්‍රමාණවත් ජල ධාරිතාවක් ලැබීමෙන් පසු එම දොරටු පරීක්ෂා කර අවශ්‍ය අඩුපාඩු නැවත සකස් කිරීම සිදුකර තිබුණි. රු. 11,389,680 ක් වූ එම නැවත සකස් කිරීම් පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දරාගත යුතු වුව ද, එම මුදල පළාත් නිශ්චිත සංවර්ධන අරමුදලට වැය බරක් වන පරිදි ගෙවා දැමීමට පළාත් සභාව කටයුතු කර තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ අදාළ වගකීම් කාල සීමාව (Retention Period) අවසාන වන තෙක් නිසි ජල ධාරිතාවක් නොලැබීම නිසා අවශ්‍ය පරීක්ෂාවන් ඉටු කළ නොහැකි විය. එම නිසා මෙම අලුත්වැඩියාව දෙපාර්තමේන්තුව මගින් ඉටු කිරීමට සිදු විය. | කොන්ත්‍රාත්කරුගේ වගකීම් කාල සීමාව අදාළ පරීක්ෂාවන් ඉටු කරන තෙක් දීර්ඝ නොකිරීමට හේතු වූ කරුණු සොයා බලා අවශ්‍ය පියවරගත යුතුය. |
| (ආ) | යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන හා පවිත්‍රකරණ ව්‍යාපෘතිය මගින් රු. මිලියන 343ක් වැය කරමින් තිරුවයියාරු ඒ්ව්රු ජලසම්පාදන ඉදිකිරීම් ප්‍රතිසංස්කරණය කර පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණි. මෙම | ජල මාර්ගයේ දෙපස ඉහළ කොටසේ වූ ඉඩම්හිමියන් විසින් ජලබාධක ඉවත් කර අනවසරයෙන් ජලය | කාර්යයන් ඉටු කිරීමට පෙර නිසි සාධ්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතියේ අරමුණ වූයේ ඉරණමඩු ජලාශයේ ජලය තිරුවයියාරු ගොවිබිම් දක්වා රැගෙන යාමයි. එහෙත්, මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත එම අරමුණ සම්පූර්ණයෙන් ඉටු වී නොතිබීම නිසා සිදුකර තිබුණු යම් යම් ඉදිකිරීම් ඉවත් කර නව ජල පාලකයක් (Regulator) ස්ථාපිත කිරීමට පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි. අදාළ ගොවිබිම් වෙත අබාධිතව ජලාපවහනය කිරීමට හැකි ද යන්න පිළිබඳ සාධ්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබීම නිසා මේ වෙනුවෙන් වැය කළ රු. 1,166,350ක මුදල අනාර්ථික වියදමක් බවට පත් ව තිබුණි. | ලබා ගැනීම මෙයට හේතුව වී තිබුණි. පසුව එම ජලබාධක සඳහා යොදා තිබුණු දැවමය දොරටු ඉවත් කර ලෝහමය දොරටු සවි කිරීමට කටයුතු කෙරුණි. වර්තමානයේ දී අවසාන ගොවිබිම දක්වා ජලය ගමන් කරන බව දන්වා සිටිමි. | |

### 1.5.8 ශීර්ෂය 470 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මන්නාරම නගර සභාවට අයත් කඩකාමර 30කට ගින්නෙන් වූ හානි සඳහා උතුරු පළාත් සභා අරමුදල් වැයකර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේදී නිකුත් කළ ණයවලින් 2019 දෙසැම්බර් 31 දිනට පැවැති රු.3,584,000ක ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.304,000ක් පමණක් නිරවුල් කර තිබුණි. | මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කරමින් පවතී. | ණය අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන 02ක් විසින් ඉදි කළ එකතුව රු. 25,792,086ක් වූ වෙළඳ පොළවල් 03ක්, කාබනික පොහොර මධ්‍යස්ථානයක්, ස්වභාවික උද්‍යානයක් සහ කුරුළු උයනක් වර්ෂ 03ත් 04ත් අතර කාලයක සිට නිෂ්කාර්යව පවතී. | මෙම වත්කම් භාවිතා කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**1.5.9 ශීර්ෂය 432 - පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------------**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාද න මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය හා එහි 31 වැනි අතිරේකය අනුව, ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදිය යුතු දින 14ක අවම කාල සීමාව නොසලකා හැර, උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.78,530,000ක් වූ වැඩසටහන් 18ක් සඳහා දින 7ත් 12ත් අතර කාලයක් පමණක් ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. | කෝවිඩ් - 19 වසංගත තත්ත්වය මෙයට හේතුව වී තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10 මාර්ගෝපදේශය පරිදි, ලංසු වලංගු කාලය පිළිවෙලින් දින 77ක් විය යුතු එකතුව රු. මිලියන 66ක් වූ කොන්ත්‍රාත් 10ක් ද, දින 63ක් විය යුතු එකතුව රු. මිලියන 56ක් වූ කොන්ත්‍රාත් 18ක් ද, දින 49ක් විය යුතු එකතුව රු. මිලියන 14ක් වූ කොන්ත්‍රාත් 12ක් ද වන පරිදි එම සියලුම ලංසු කැඳවීම් වෙනුවෙන් උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ යාපනය ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය විසින් වලංගු ලංසු කාලය දින 42ක බැගින් සීමාකර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී ලබාගෙන තිබුණු අභ්‍යන්තර තීරණයකට අනුව කටයුතු කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ICTAD/SBD/03 ලේඛනය 01 වගන්තියේ 30 ඡේදය පරිදි ලංසුකරු තෝරාගත් බවට දැනුම් දීම සිදු කළ දිනයේ සිට දින 28ක් ඇතුළත දී ඒ වෙනුවෙන් ගිවිසුම්ගත විය යුතු වුවත්, පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.20,835,000ක් වූ වැඩ 09ක් සඳහා දින 48ත් දින 84ත් අතර කාල ප්‍රමාදයකින් පසුව ගිවිසුම් අත්සන් කර තිබුණි. | කෝවිඩ් - 19 වසංගත තත්ත්වය මෙයට හේතුව වී තිබුණි. | එකඟ වූ කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.5.10 ශීර්ෂය 441 - පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උතුරු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් කයිතඩි රජයේ වැඩිහිටි නිවාසයට ආහාර ලබා දීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරිම සඳහා කමිටුවක් පත්කර ඇත. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර අවශ්‍ය ඉදිරි පියවර ගත යුතුය. |
| (අ) තෝරාගත් ලංසුකරු සමග එළැඹි ගිවිසුමට අනුව, එකඟ වූ මිල ගණන්වලට වඩා වැඩි මිල ගණන් මත ගෙවීම් කිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළ පළාත් සභාවට රු.200,070 ක පාඩුවක් සිදු වී තිබුණි. | | |
| (ආ) මෙම ප්‍රසම්පාදනයේදී විවිධ ලංසුකරුවන් විසින් යම් යම් භාණ්ඩ සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එහෙත්, ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුකරුවන් ඉදිරිපත් කළ සමස්ත මිල කියුමේ මුළු වටිනාකම පමණක් සැලකිල්ලට ගෙන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු තෝරා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළ දී පළාත් සභා අරමුදල්වලට රු.2,655,746ක පාඩුවක් සිදු වී තිබුණි. | | |
| (ඇ) ලංසුකරුවෙකු විසින් භාණ්ඩ 08ක් වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු මිල ගණන් වෙළඳපොළ මිලට වඩා සියයට 46 සිට සියයට 98 දක්වා අඩු අගයක් ගෙන තිබුණි. එය අතාත්වික තත්ත්වයක් බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 මාර්ගෝපදේශය අනුව අදාළ ලංසුකරුගෙන් මේ පිළිබඳ පැහැදිලි කිරීම් ලබාගත | | |

යුතු ව තිබුණි. එහෙත්, ඒ කිසිවක් පිළිබඳ සැලකිලිමත් නොවී එම ප්‍රශ්ණගත මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

**1.5.11 ශිර්ෂය 460 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින කළාප 12කින් රාජකාරියට වාර්තා නොකළ ගුරුවරුන් 255කට එරෙහිව සේවයෙන් පහකිරීම සඳහා වූ විනය පියවර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7.1 වගන්තිය පරිදි අප්‍රමාදව ගෙන නොතිබුණි. එම ප්‍රමාදය මාස 1ත් වර්ෂ 6 ½ ත් අතර පරාසයක පැවැතිණි. | අදාළ ගුරුවරුන් සමග සංනිවේදනය අපහසු වී තිබීම මෙම ප්‍රමාදයට හේතුව වී තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | වවුනියා දකුණ කළාප අධ්‍යාපන කාර්යාලය යටතේ රාජකාරි ඉටු කරන ගුරුවරුන් 13දෙනෙකුගේ තනතුරු ස්ථිර කළයුතු කාල පරිච්ඡේදය අවසන් වී වර්ෂ 4ත්, වර්ෂ 32ත් අතර කාල ප්‍රමාදයක් සිදු වී තිබුණද, අංක 1817/30 හා 2013 ජූලි 03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ උතුරු පළාත් **රාජ්‍ය** සේවා කාර්ය පරිපාටි හා රීති සංග්‍රහය VIII පරිච්ඡේදය පරිදි ස්ථිර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ස්ථිර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අප්‍රමාදව අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 02 ඡේදයේ IV වගන්තියට **පටහැනිව** ඇඟිලි සලකුණු සටහන් මගින් පැමිණීම තහවුරු නොකළ වවුනියා දකුණ කලාප අධ්‍යාපන | පැමිණීමේ ලේඛනය අනුව පැමිණීම තහවුරු කර ගෙවීම් සිදුකර තිබුණි. | නීත්‍යානුකූල නොවූ හෙයින් ආපසු අයකර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකුට නිවාඩු දින දීමනා ලෙස රු.90,710ක් ගෙවා තිබුණි. | | |
| (ඇ) | 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3.4 (II) ඡේදයට පටහැනිව, කලාප අධ්‍යාපන බල ප්‍රදේශ 07ක සේවය කරන ගුරුවරුන් 31 දෙනෙකු වර්ෂ 01ත් වර්ෂ 06ත් අතර කාලයක සිට ස්ථිර පදිංචි ස්ථානයට යාබද පාසැලකට තාවකාලිකව අනුයුක්ත වී සේවය කරමින් සිටී. | මින් ඉදිරියට මෙවැනි තත්ත්වයන් පිළිබඳ සැලකිල්ලෙන් කටයුතු කරනු ලැබේ. | තාවකාලික අනුයුක්ත කිරීම් සිදු නොකළ යුතුය. |
| (ඉ) | 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3.2 ඡේදයට පටහැනිව, අධ්‍යාපන කලාප 12ක වූ ගුරුවරුන් 490 දෙනෙකු ස්ථාන මාරු වීම් නොලබා එකම පාසැලේ වර්ෂ 8ත් වර්ෂ 32ත් අතර කාලයක් සේවය කරමින් සිටී. | මේ සඳහා අවශ්‍ය උපදෙස් අදාළ නිලධාරීන් වෙත ලබා දී තිබුණි. | නියම කාලය තුළ ස්ථාන මාරුවීම් සිදුකළ යුතුය. |
| (ඊ) | වවුනියා උතුර කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකු 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.10,557,045ක ගුරු වැටුප් වංචනිකව ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එලෙස වංචනික ලෙස ලබාගත් ගුරු වැටුප් මුදල රු.11,448,400ක් විය. | රුපියල් මිලියන 1.5ක් අයකළ අතර හිඟ ශේෂය වෙනුවෙන් නීතිමය කටයුතු සිදු කරමින් පවතී. | හිඟ ශේෂ නොපමාව අයකරගත යුතුය. |
| (උ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පැවැති පාසැල්වල ගුරුවරුන් 1609ක් සහ විදුහල්පතිවරුන් 182ක පුරප්පාඩු පැවැති අතර නියෝජ්‍ය විදුහල්පතිවරුන් 30 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතිණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත නිලධාරීන් ඵලදායී ලෙස අනුයුක්ත කිරීමටත් පියවර ගත යුතුය. |

**1.5.12 ශිර්ෂය 851- ඉඩම් පාලන දෙපාර්තමේන්තුව**

**--------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | --------------------- | ------------ |
| (අ) | උතුරු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් වවුනියාව ප්‍රදේශයේ වූ ඉඩම් බදු දීමෙන් ලැබිය යුතු එකතුව රු.13,245,047 ක බදු ගාස්තු අංක 96/05 දරන 1996 අගෝස්තු 01 දිනැති ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 07 ඡේදය පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. එම බදු අයකර ගැනීමට ප්‍රමාද වී තිබුණු කාලය වර්ෂ 05ත් වර්ෂ 27ත් අතර පරාසයක විය. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | චක්‍රලේඛ උපදෙස් පරිදි නොපමාව කටයුතු කර හිඟ බදු අයකර ගත යුතුය. |
| (ආ) | පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය විසින් උතුරු පළාතේ ග්‍රාම නිලධාරී වසම් 46ක් තුළ හඳුනාගත් ඉඩම් ගැටලු 3403කින් ගැටලු 366ක් ඉකුත් වර්ෂය තුළ නිරවුල් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ නිරවුල් කර තිබුණේ ගැටළු 108ක් පමණි. | මේ සඳහා රජයේ වෙනත් දෙපාර්තමේන්තු සම්බන්ධ කරගත යුතු වීම නිසා ප්‍රමාදයක් පවතී. | මෙය සංවේදී ගැටලුවක් බැවින් ප්‍රමුඛතාව ලබා දී ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | පදිංචි වීමේ අරමුණින් ලබා දී තිබුණ ද, පසුව එම භූමිය කඩකාමර 100කින් පමණ සමන්විත වෙළඳ සංකීර්ණයක් ලෙස කිලිනොච්චිය, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථාපිතව තිබුණි. අංක 2017/01 හා 2017 ජූලි 04 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය පරිදි එම කඩ කාමරහිමියන් සමග ගිවිසුම්වලට එළැඹ බදු ආදායම් රැස් කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | මේ වෙනුවෙන් දේපළ හිමියන්ට අයදුම් පත්‍ර ලබා දී තිබුණ ද, ඔවුන්ගෙන් 07 දෙනෙකු පමණක් අයදුම්පත්‍ර සම්පූර්ණ කර භාර දී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කර නොපමාව ගිවිසුම්ගත වී අදාළ බදු ආදායම් රැස් කිරීමට පියවරගත යුතුය. |

**1.5.13 ශීර්ෂය 853- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)**

---------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ පළාත් දෙපාර්තමේන්තු 04ක් හා අමාත්‍යාංශ 02ක් විසින් වාහන සේවා කිරීම සඳහා තෝරා ගත් සැපයුම්කරු එකම කාලපරිච්ඡේදයක් තුළ දී එකම වර්ගයේ වාහන සේවා කිරීම වෙනුවෙන් විවිධ වූ මිලගණන් ඉදිරිපත් කර තිබුණි. මෙම සියලු ආයතනවල වාහන සේවා කිරීමේ ප්‍රසම්පාදන හා සම්බන්ධ සියලු තාක්ෂණික ඇගැයීම් කමිටුවල සභාපති ලෙස උතුරු පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයා සිටි නමුත් ඉදිරිපත් කළ මෙම විෂම මිල ගණන් පිළිබඳ කිසිදු ඇගයීමක් ඔහු විසින් සිදුකර නොතිබුණි. | එක් ආයතනයක් වෙනුවෙන් ලබාගත් තීරණයක් තවත් ආයතනයකට අදාළ කරගත නොහැකි වේ. එමෙන්ම, තාක්ෂණික ඇගයීම් කමිටුවලට විවිධ සාමාජිකයින් සහභාගි වන නිසා මෙවැනි තීරණ ගැනීමට සිදු වී තිබුණි. | මේ පිළිබඳ විමර්ශනයක් සිදුකළ යුතුය. |

**1.5.14 මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| උතුරු පළාත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කළ ආංශික ජයග්‍රහණ පිළිබඳ තත්ත්ව වාර්තාව (Status Report on Sectorial Achievement) පරිදි, උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ප්‍රමුඛතාව ලබාදුන් පහත වැඩසටහන් මේ දක්වා අවසන් කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය මත අවශ්‍ය සේවක බඳවා ගැනීම් සිදු නොකිරීම නිසා (i) හා (iii) අරමුණු ඉටු කළ නොහැකි විය. අවශ්‍ය නීති සම්පාදනය කිරීමට | ඉටු කර ගැනීමට තීරණය කළ මෙම ඉලක්ක අප්‍රමාදව ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| **(i)** පළාත් අතර ආසන වෙන්කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.<br>**(ii)** පාසැල් ප්‍රවාහන සේවා හා තිරෝද රථ සේවා විධිමත් කිරීමේ ක්‍රමවේද ස්ථාපිත කිරීම.<br>**(iii)** උතුරු පළාත් ගමනාගමන සේවයේ නිරත පුද්ගලික බස්රථ අධීක්ෂණය කිරීමේ පද්ධතිය (**GPS System**) ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන. | නොහැකි වීම නිසා (ii) වන කරුණ ඉටුකළ නොහැකි විය. |